හදා වඩා ගැනීම

1. පරිදර්ශනය
2. දරු කමට හදා ගන්නේ ඇයි?
3. දරු කමට හදා ගත හැක්කේ කාට ද?

ශ්‍රී ලංකාවේ දී ළමයෙක් දරුකමට හදා ගැනීම පිළිබඳ තොරතුරු සඳහා Intercountry Adoption Sheet for Sri Lanka බලන්න.

දරුකමට හදා ගන්නේ ඇයි?

දරුකමට හදා ගන්නේ ඇයි?
"ඔහුගේ හෝ ඇයගේ පෞරුෂයේ පූර්ණ හා සුසංවාදී සංවර්ධනයක් සඳහා ළමයා වර්ධනය විය යුත්තේ ආදරය, අවබෝධය හා සතුටින් පිරුණු පවුල් පරිසරයකයි. උපන් රටේ ඔහුට හෝ ඇයට සුදුසු පවුලක් සොයා ගත නො හැකි දරුවෙකුට ස්ථිර පවුලක් ලබා දීමේ වාසි සහගත තත්වය රටවල් අතර දරුකමට හදා ගැනීම තුළින් ලැබේ."

- **දරුකමට හදා ගැනීම පිළිබඳ හේග් ප්‍රඥප්තියේ පූර්විකාව**

ආදරයෙන් පිරුණු නිවසක් ඉතා ගැඹුරු ආකාරයෙන් සෑම ළමයෙකුට ම යහපතක් ගෙන එයි. රටවල් අතර දරුකමට හදා වඩා ගැනීමට හැකි වීම නිසා ලොව පුරා ළමයින් සිය දහස් ගණනකට ස්ථිර වශයෙන් ම මෙවැනි තත්වයක් ලබා දීමට හැකිවී තිබේ. ළමයින්ට ඔවුන්ගේ නෑයන් සමග සිටීමට නො හැකි විට හා ඔවුන්ගේ ප්‍රජාව තුළින් අලුත් දෙමාපියන් සොයා ගත නො හැකි විට රටවල් අතර දරුකමට හදා ගැනීම නිසා මෙම ළමයින්ට ස්ථිර පවුලක රැකවරණය, ආරක්ෂාව හා ආදරය ලබා දීමට නව මගක් විවෘත වී තිබේ.

අතිරේක සම්පත් කීපයක්

Child Welfare Information Gateway – එක්සත් ජනපද සෞඛ්‍ය හා මානව සේවා දෙපාර්තමේන්තුවේ ළමා හා පවුල් පරිපාලනය යටතේ ඇති ළමා කාර්යාංශයේ සේවාවකි.

Medline Plus- වෛද්‍ය විද්‍යාව පිළිබඳ එක්සත් ජනපද ජාතික පුස්තකාලයේ හා ජාතික සෞඛ්‍ය ආයතනයේ සේවාවකි.

A Healthy Beginning: Important Information for Parents of Internationally Adopted Children (PDF 167KB)- ඇමෙරිකානු ළමා වෛද්‍ය ආයතනයේ පොත් පිංචකි.

"ආදරයෙන් පිරුණු නිවසක් සොයා ගැනීමට සෑම ළමයෙකුට ම සහාය වීමට මගේ පරිපාලනය කැප වී සිටී" – ජනාධිපති බැරක් ඔබාමා, 2012 ජාතික දරුකමට හදා ගැනීමේ මාසය වෙනුවෙන් කළ ජනාධිපති ප්‍රකාශනය.

දරුකමට හදා ගත හැක්කේ කාට ද?

වෙනත් රටක දරුවෙක් හදා වඩා ගැනීමට හා එම දරුවා එක්සත් ජනපදයේ ජීවත් වීම සඳහා ගෙන ඒමට පෙර ඔබ එක්සත් ජනපද නීතිය යටතේ දරුවෙක් හදා වඩා ගැනීමට සුදුසුකම් ලබා තිබිය යුතුය. මෙය තීරණය කරන ෆෙඩරල් ආයතනය වන්නේ මව්බිම ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කොටසක් වන එක්සත් ජනපද පුරවැසිබව හා සංක්‍රමණ සේවාවයි. (USCIS) වෙනත් රටක දරුවෙක් හදා වඩා ගැනීමට ඔබට සුදුසුකම් ඇති බව එක්සත් ජනපද පුරවැසිභාවය හා සංක්‍රමණ සේවය (USCIS) තීරණය කරන තුරු ඔබ දරුකමට හදා ගන්නා ළමයෙක් (හෝ දරුකමට හදා ගැනීම හා සංක්‍රමණ කටයුතු සඳහා ඔබට නෛතික අයිතිය ලැබී ඇති ළමයෙක් හෝ) එක්සත් ජනපදයට නො ගෙනා යුතුය.

ජාතික අවශ්‍යතා

ඔබ දරුකමට හදා ගන්නා, විදේශයක ඉපදුණු ළමයෙක් එක්සත් ජනපදයට ගෙන ඒම සඳහා ඔබ අවශ්‍යතා ගණනාවක් සපුරා තිබිය යුතුය. මූලික අවශ්‍යතා පහත දැක්වේ.

1. ඔබ එක්සත් ජනපද පුරවැසියෙක් විය යුතුයි.
2. ඔබ අවිවාහක නම් අඩු වශයෙන් වයස අවුරුදු 25ට වැඩි විය යුතුය.
3. ඔබ විවාහක නම් දෙදෙනා ඒකාබද්ධ ව ළමයා හදා වඩා ගත යුතුය (ඔබ වෙන් ව සිටියත් දික්කසාද වී නැත්නම්). ඔබේ කලත්‍රයා ද එක්සත් ජනපද පුරවැසියෙක් හෝ එක්සත් ජනපදයේ නීත්‍යනුකූල ව සිටින කෙනෙක් විය යුතුය.
4. අපරාධ පසුබිම් පරීක්ෂා, ඇඟිලි සලකුණු හා නිවෙස් අධ්‍යයනය ඇතුළු දරුකමට හදා ගන්නා දෙමාපියෙකුගේ යෝග්‍යත්වය තීරණය කරන සමහර අවශ්‍යතා ඔබ විසින් සපුරාතිබිය යුතුය.

ප්‍රාන්ත අවශ්‍යතා

එක්සත් ජනපද නීතිය යටතේ දරුකමට හදා ගැනීමට සුදුසුකම් ලැබීමට අමතරව දරුකමට හදා ගන්නා දෙමාපියෙක් ලෙස ඔබේ ප්‍රාන්තයේ අවශ්‍යතා ද සපුරාලීම අවශ්‍ය වේ. ඒ ඒ ප්‍රාන්තවල අවශ්‍යතා ගැන දැන ගැනීමට Child Welfare Information Gateway නම් වෙබ් අඩවියට යන්න.

විදේශ රටවල අවශ්‍යතා

ළමයින් දරුකමට හදා ගන්නා දෙමාපියන් සඳහා සෑම රටක ම ඔවුන්ගේ ම අවශ්‍යතා තිබේ. ඒවා මෙම වෙබ් අඩවියේ රටවල තොරතුරු අඩංගු වන කොටසේ විස්තර කර ඇත.